# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

# (Recovery Plan for Learning Loss – 2022)

(10 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 10 ශ්‍රේණිය- දෙවන වාරය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| **10 ශ්‍රේණිය දෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | |
| 1 නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.4 වේදිකා නාට්‍යවල විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම. (සිද්ධාන්ත) | ▪ සජීවී කලාවක් ලෙස නාට්‍යයෙහි සුවිශේෂී බව ප්‍රකාශ කරයි.<br>▪ නාට්‍යයෙහි කතා වස්තුව මුල, මැද, අග සහිත සිදුවීම් මාලාවක් හෝ අවස්ථාවක් ඇතුළත් ව ඇතත් ඒවා අනුපිළිවෙළ සාහිත්‍යය, නාට්‍යයක සුවිශේෂී ලක්ෂණයක් බව ප්‍රකාශ කරයි.<br>▪ නාට්‍යය ප්‍රේක්ෂකයන් හමුවට ඉදිරිපත් කිරීම සඳහා සතර අභිනය භාවිත කරන ආකාරය විස්තර කරයි.<br>▪ නාට්‍යයක් සඳහා යොදා ගන්නා ආනුෂංගික ශිල්ප නම් කරයි.<br>▪ නාට්‍යය යනු සාමූහික ප්‍රයත්නයක යහපත් වූ ප්‍රතිඵලයක් බව ප්‍රකාශ කරයි. | ▪ නාට්‍ය පෙළ හෙවත් පිටපතක, කතා වස්තුව, පෙළ ගැස්ම, අවකාශ භාවිතය, ශෛලිය, අපූර්ව අත්දැකීම් ඇතුළත් ව ඇති බව<br>▪ සතර අභිනය භාවිතය<br>▪ ආනුෂංගික කලා ශිල්ප සුසංයෝගී වන ආකාරය<br>▪ නාට්‍යය සඳහා ප්‍රේක්ෂක සහභාගිත්වය හා සජීවී බවෙහි විශේෂතා<br>▪ ප්‍රේක්ෂක අවධානය ලබා ගැනීම සඳහා විශේෂ රංග ප්‍රයෝග, ප්‍රවේශන රටා, නිෂ්ක්‍රමණ රටා බලපාන ආකාරය | 1.4 වේදිකා නාට්‍යයෙහි විශේෂතා හඳුනා ගනියි. | 02 |
| | 1.5 රූපණ ශිල්පියා ගේ කාර්යභාරය හඳුනාගනිමු. (සිද්ධාන්ත) | ▪ ''රූපණය'' යන්න හඳුනා ගනියි.<br>▪ ශිල්පීය කුශලතා වර්ධනය කර ගනියි. ▪ අනුකරණය සහ සමාරෝපය, රූපණය සඳහා උපයෝගී කර ගනියි. ▪ රූපණයේ දී සතර අභිනය භාවිතය විශේෂ වන ආකාරය නිරීක්ෂණය කරයි. ▪ රූපණ ශිල්පියෙකුට අවශ්‍ය ගුණාංග හඳුනාගනියි. | ▪ රූපණය අර්ථ කථනය<br>▪ රූපණයේ දී අනුකරණය හා සමාරෝපය යන ක්‍රියාවලියේ වැදගත්කම.<br>▪ රූපණය පුහුණු වීමේ දී නළුවන් විසින් ප්‍රගුණ කළ යුතු අංශ.<br>1. අභ්‍යන්තරික ප්‍රකාශනය (සිත)<br>2. බාහිර ප්‍රකාශනය (ශරීරය හා කටහඬ) | 1.5 රූපණ කාර්යයේ දී ශිල්පියෙකු ප්‍රගුණ කළ යුතු කුශලතා හා ගුණාංග හඳුනා ගනියි. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ▪ රූපණයේ දී පරිකල්පනය භාවිතය හා විශේෂ අවධානය යොමු කළයුතු කරුණු | | |
| 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.5 ක්ෂණික නිරූපණයේ යෙදීම (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | ▪ සිසුන් සාමූහික ව නිශ්චිත නිරූපණයන් හි යෙදෙයි. සාමූහික ව සාකච්ඡා කර අවස්ථාවන් ගොඩනගා ගැනීමට හැකියාව ලබයි. ▪ ඒකල ව ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි. ▪ සාමූහික ව කටයුතු කරයි. ▪ රංගන කුසලතාව, පරිකල්පනය දියුණු කර ගනියි. | ▪ ක්ෂණික නිරූපණ අර්ථකථනය ▪ ක්ෂණික නිරූපණ ක්‍රියාකාරකම් | 2.5 පවරනු ලබන ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි. | 02 |
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි. | 3.4.1 මුහුණ රචනා කරමු | ▪ අංග රචනය යනු කුමක්දැයි අදහස් පළ කරයි. ▪ මුහුණේ කලාප හඳුනා ගෙන නම් කරයි ▪ අංග රචනා ද්‍රව්‍ය නම් කරයි. ▪ නිවැරදි ව අංග රචනයෙහි යෙදෙයි | ▪ අංග රචනය යන්න හැඳින්වීම ▪ මුහුණෙහි කලාප නම් කිරීම ▪ අංග රචනා ද්‍රව්‍ය නම් කිරීම ▪ අංග රචනා කිරීමේ සූදානම ▪ අංග රචනය කාර්යයෙහි නියැළීම | 3.4 අංග රචනය හා රංග භාණ්ඩ නිර්මාණය කරයි. | 02 |
| 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.3.1 : රංගන ශිල්පීන් හඳුනා ගනිම | ▪ නම් කරන ලද රංගන ශිල්පීන් හඳුනාගත් බව පවසයි. ▪ ඔවුන් රග පෑ විවිධ නාට්‍ය කෘති නම් කරයි. ▪ ඔවුන්ගේ රංගන අවස්ථාවන් විමසා බලයි. | ▪ මානෙල් ජයසේන, විජය නන්දසිරි, කෞශල්‍යා ප්‍රනාන්දු, ශ්‍රියන්ත මෙන්ඩිස්, ජැක්සන් ඇන්තනී, විජේරත්න වරකාගොඩ යන රංගන ශිල්පීන්ගේ, රංගන අවස්ථා විමසා බැලීම. නාට්‍ය කෘති නම් කිරීම. | 4.3 ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංග | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ඔවුන් රංගනයේ නියුතු වූ වෙනත් කලා අංශ සොයා බැලීම. | ශිල්පීන් හඳුනා ගනියි. | |
| 5. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5.1.1 කාලගෝල නාට්‍යයේ තේමාව හා වස්තුව හඳුනාගනිමු. | ■ දික්තල - කාලගෝල නාඩගමට පාදක වූ කතා වස්තුව හා තේමාව හඳුනා ගත් බව පවසයි.<br>■ මූල බීජය හා නාට්‍ය පෙළ අතර වෙනස වැටහෙන බව පවසයි.<br>■ නාඩගම් සම්ප්‍රදායයේ ලක්ෂණ හඳුනාගත් බව කියයි.<br>■ නාට්‍ය පෙළින් ඉස්මතු වන නාට්‍ය දෘෂ්ටිය හඳුනා ගත් බව පවසයි. | ■ උම්මග්ග ජාතකයේ සඳහන් වන කාලගෝල ප්‍රශ්නය සහ දික්තල - කාලගෝල නාට්‍ය පෙළ කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දීම.<br>■ කාලගෝල කතා වස්තුව<br>■ දික්තල-කාලගෝල නාට්‍ය පෙළ කියවීම<br>■ නාට්‍ය පෙළ හා මූලාශ්‍ර කතාව අතර සමාන අසමානතා.<br>■ කතා වස්තුවේ තේමාව දෘෂ්ටිය<br>■ නාට්‍යයේ දී එම තේමාවට එක් වන නව දෘෂ්ටිය | 5.1 නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින් සාමූහිකව රස විඳියි. | 08 |
| | 5.1.2 ''කාලගෝල රස විඳිමු'' | ■ නාඩගම් සම්ප්‍රදාය හා නාට්‍ය ධර්මී ශෛලීන් හඳුනා ගනියි.<br>■ නාට්‍යයක සතර අභිනය යොදා ගන්නා අයුරු විමසයි.<br>■ පුද්ගල මනෝභාව පිරික්සයි.<br>■ නාට්‍යයේ ගැටුම් අවස්ථා විමසයි.<br>■ නාට්‍ය පෙළ මැනවින් හඳුනාගත් බව කියයි. | ■ නිර්දිෂ්ට පෙළෙහි දක්නට ලැබෙන නාඩගම් සම්ප්‍රදායට අයත් ලක්ෂණ, නාට්‍ය ධර්මී ශෛලිය, සංවාද, චරිත, අවස්ථා හා සිද්ධීන්, ගැටුම් අවස්ථා, තේමාව. සතර අභිනය භාවිත වන ආකාරය, අංග රචනය හා වෙස් ගැන්වීම්වල ස්වාභාවිකත්වය ඉක්මවා යන පරිකල්පනාත්මක බව විමසීම. | | |